**කඩුගන්නාව නගර සභාව - 2022**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කඩුගන්නාව නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කඩුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව 2023 වර්ෂයේ ගෙවීම් කළ රු.130,465 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.49,392 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පරීක්ෂා කර බලා ඉදිරි වර්ෂයේදී ගිණුම්ගත කරන බව. | -එම- |
| (ඇ) | 2018 මාර්තු 13 දින වෙන්දේසි කර තිබුණු රු.97,875 ක ඡායා පිටපත් යන්ත්‍රයේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ දී ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම්ගත කරන බව. | -එම- |
| (ඈ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ දිරන කසළ අලෙවි කිරීමෙන් ලද ආදායම පිළිවෙලින් රු.215,678 ක් හා රු.431,547 ක් තැන්පත් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ආදායම ලැබෙන අවස්ථාවේ තැන්පත් ලෙස ගිණුම්ගත කළ බව. | ආදායම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂ හා ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උප ලේඛනවල දැක්වෙන ශේෂ සමඟ සැසඳීමේදී රු.771,252 ක වෙනසක් පැවතුණි. | උපයෝගී ලේඛන නිවැරදි විය යුතු බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,898,130 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 104,220 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,000,000 | 7,646,784 | 7,753,822 | 6,773,112 | 8,000,000 | 7,574,636 | 7,649,538 | 6,880,150 |
| (ii) | කුලී | 3,475,000 | 3,347,446 | 3,505,947 | 1,464,511 | 5,220,000 | 2,749,815 | 2,230,597 | 1,623,012 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 750,000 | 695,469 | 691,969 | 29,500 | 770,100 | 567,096 | 541,396 | 26,000 |
| (iv) | වෙනත් ආදායම් | 13,600,000 | 9,596,770 | 2,192,605 | 7,785,764 | 14,700,000 | 1,683,876 | 1,561,976 | 381,599 |
| | | 25,825,000 | 21,286,469 | 14,144,343 | 16,052,887 | 28,690,100 | 12,575,423 | 11,983,507 | 8,910,761 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.6,773,112 ක් වූ අතර, ඒකකයක වරිපනම් බදු හිඟය රු.5,000 ඉක්මවූ වරිපනම් ඒකක 266 කින් එකතුව රු.2,162,210 ක් විය. | දේපල තහනම් කිරීම් කටයුතු මේ වන විටත් සිදුකරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර ආදායම් රැස්කළ යුතුය. |

**(ආ) කඩ කුලී**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සභා දේපල 15 කින් රු.1,219,860 ක හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟයන් අයකර ගැනීමට කටයුතු කරමින් සිටින බව. | හිඟ කුලී අයකළ යුතුය. |
| (ii) | රු.401,228 ක හිඟ කඩ කාමර කුලී නොගෙවූ වෙළඳ සංකීර්ණ 03 ක කඩ කාමර 12 කට අදාළ හිඟ කුලී අයකර ගෙන නොතිබුණි. | කපා හැරීමට යෝජිත ශේෂයන් ඉවත් කර හිඟ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | -එම- |

**(ඇ) බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| වෙළඳ ආයතන 34 ක් සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් නොකිරීම හේතුවෙන් රු.29,500 ක වෙළඳ බලපත්‍ර ආදායමක් හා රු.98,200 ක ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කරන බව. | බලපත්‍ර ගාස්තු අයකළ යුතුය. |

**(ඈ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.337,500 ක හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගෙන නොතිබුණි. | නොගෙවූ දැන්වීම් පුවරු ගලවා ඉවත් කළ බවත් හිඟ ගෙවීමට එකඟ වී ඇති බව. | හිඟ ආදායම් අයකළ යුතුය |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.11,749 ක් හා මුද්දර ගාස්තු රු.7,187,000 ක් විය. | පරීක්ෂා කර බලා අය කිරීමට කටයුතු කරන බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 118 වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලී රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට කටයුතු කරන බව. | පනතේ කාර්යයන් ඉටුකළ යුතුය. |
| (ආ) | ආදාහනාගාරයේ පවතින දර උදුන වසර 1 1/2 පමණ සිට අක්‍රීයව පැවති අතර, දර උදුන අලුත්වැඩියා කර හෝ LP ගෑස් යොදාගෙන හෝ දේහයන් ආදාහන කටයුතු සඳහා යොදාගැනීමට කටයුතු නොකර ආදාහනාගාරයේ වැටක් ඉදිකිරීම සඳහා ඉකුත් වර්ෂයේදී රු.1,799,975 ක් වැය කර තිබුණි. | කඩිනමින් අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දුම්රිය දෙපාර්තමේන්තුව සතු වර්ග අඩි 8000 ක් පමණ ගරා වැටී ඇති පොහොර ගබඩාව සංචාරක කටයුතු සඳහා යෙදවීමේ අරමුණින් ශිවිසුම්ගත වීමකින් තොරව රු.1,166,400 ක තැන්පතුවක් හා මාසික කුලිය රු.194,401 ක් ලෙස එකතුව රු.1,360,801 ක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීම් කර තිබුණි. මෙම ගොඩනැගිල්ල නැවත දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දී ඇති අතර සභාව ගෙවූ තැන්පත් මුදල් ආපසු අයකර ගෙන නොතිබුණි. | අදාළ ගොඩනැගිල්ල දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දී ඇති බව. | ගෙවූ මුදල් කඩිනමින් අය කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.362,447 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ එකතුව රු.235,234 ක් විය. | විගණන විමසුමක් පවතින බැවින් ප්‍රතිපූර්ණය කර හෝ ගෙවීම් කර නොමැති බව. | නිවැරදි කර ලැබිය යුතු මුදල් ලබා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් ණයහිමි ශේෂය රු.8,752,313 ක් වූ අතර ඉන් වසර 1 ත් 3 ත් අතර කාලයට අදාළ එකතුව රු.1,087,414 ක් හා වසර 3 ත් 5 ත් අතර කාලයක් පවතින එකතුව රු.202,302 ක් විය. | බිල්පත් මෙතෙක් ලැබී නොමැති බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් වාහනයක් 2022 ජනවාරි 12 දින අනතුරට ලක්වී 2022 පෙබරවාරි 11 දින අලුත්වැඩියාව සඳහා ගරාජයක් වෙත යොමුකර තිබූ අතර රක්ෂණ ආවරණය රු.199,975 ක් ලැබී තිබියදීත් වාහනය අලුත්වැඩියා කර සභාවට ගෙන්වා නොගෙන පෞද්ගලික ගරාජයක් තුළ රඳවාගෙන තිබුණි. | තක්සේරු කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදුකරන බව. | අලුත්වැඩියා කර උපයෝජනය කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් අබලන් වූ වාහන 03 ක් අලුත්වැඩියා කිරීමකින් තොරව පැරණි සභා භූමියේ ගාල් කර පැවතුණි. | තක්සේරු කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදුකරන බව. | අලුත්වැඩියා කර උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.357,579,250 ක් වටිනා ඉඩම් කැබලි 04 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්පත් කර ගැනීම සඳහා අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇති බව හා අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | ඉඩම්වල අයිතිය පවරා ගත යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 11 ක පුරප්පාඩු 20 ක් ද තනතුරු 02 ක අතිරික්තතා 17 ක් ද පැවතුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි පුරප්පාඩු පිළිබඳ කටයුතු කළ නොහැකි බව හා අතිරික්ත කාර්යය මණ්ඩලය සංවර්ධනය නිලධාරීන් බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| **(ආ)** | **සේවක ණය** | | |
| | 2019 හා 2020 වර්ෂයන් තුළ සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් හා සේවකයින් 5 දෙනෙකුගෙන් එකතුව රු.423,253 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය සේවකයින්ගේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා අවම වර්ෂ දෙකකට වරක් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් හා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | මේ වන විට කටයුතු කරමින් සිටින බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 03 ක සියයට 29 සිට සියයට 87 දක්වාද, වියදම් විෂයයන් 11 ක සියයට 23 සිට සියයට 99 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ගෙවීම් අඩුවෙන් සිදුවීම, අපේක්ෂිත වැඩසටහන් නොපැවැත්වීම හා ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතු වූ බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය පිළියෙල කර ගත යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ළඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාළ කටයුතු ඉටුකරන බව. | තිරසර සංවර්ධන දර්ශක හඳුනාගෙන අරමුණු හා ඉලක්ක ඉටුකර ගත යුතුය. |